# මොඩියුල අංක 04

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප

e-Learning by TEA
Teacher Education Administration Branch

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION


# ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද

**හැඳින්වීම**

පාසල් පන්ති කාමරය තුළ පමණක් ඉගෙනුම් ක්‍රියාවලිය සිදුවන බවටත් පංති කාමරයේ දී සිසුන් නිශ්ශබ්දව සිටින තරමට ගුරුවරයෙකුගේ කාර්යභාර සාර්ථක බවටත් 20වන ශත වර්ෂයට පෙර බහුතරයක් ගේ මතය වී තිබූ බව නොරහසකි. නමුත් 21වන ශතවර්ෂයේ දී අධ්‍යාපන පර්යේෂණ මගින් තහවුරු වූ පරිදි අභියෝග හමුවේ සාර්ථක දිවි පෙවතක් සඳහා ශිෂ්‍යයන් සතු කුසලතා ඔප් නැංවීම පිණිස ශිෂ්‍ය ක්‍රියාකාරී ක්‍රමවේද භාවිතා කරමින් ඉගැන්වීම ගුරුවරයාගේ කාර්යභාරයේ ප්‍රමුඛ ස්ථානයක් ගත යුතුව ඇත.

------ ------- -----

ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක විද්‍යාමානවන ලක්ෂණ වනුයේ..




------ ------- -----

අරමුණු:

1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා භාවිතා කළ හැකි ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේදයන්හි ලක්ෂණ හඳුනා ගැනීම
2. ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේදයන් සැලසුම්කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉගෙනුම් පරිසරය නිර්මාණය කිරීම

ඉගෙනුම් ඵල:

1. ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද තුළින් ඉගෙනුම්ලාභියා ඉගෙනුමට පෙළඹවීම
2. ඉගෙනුම්ලාභියාගේ නිපුණතා සංවර්ධනය
3. සිසු-සිසු සහ ගුරු-සිසු අන්‍යොන්‍ය සහයෝගය වැඩිදියුණු වීම


------ ------- -----

පෙළගැස්ම:

1. ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද තෝරා ගැනීමේ අවශ්‍යතාව
2. ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද
3. ගැටලු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රියාවලිය
4. ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රියාවලිය
5. භූමිකා රංගන/නාට්‍ය ක්‍රම
6. ඇගයීම

------ ------ -----

**ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද තෝරා ගැනීමේ අවශ්‍යතාව**




ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද තෝරා ගැනීමේ අවශ්‍යතාව උක්ත ප්‍රබල විචල්‍යයන් මත පදනම් වන අතර එය ඉගෙනුම්ලාභියාගේ සාර්ථකත්වයට සෘජුවම බලපාන සාධකවන බවට නවීන අධ්‍යාපන පර්යේෂණවලින් සනාථ වී ඇත.

----- ----- -----

# ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද

ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද රාශියක් පවතින අතර ඉන් කීපයක් ඔබගේ දැනුවත් වීම සඳහා පහතින් දක්වා ඇත.




මෙම සියලු ශිල්ප ක්‍රම ඔස්සේ ගුරුභවතෙකු ප්‍රමුඛ ලෙසම ප්‍රයත්න දැරිය යුතු වන්නේ ඉගෙනුම්ලාභීන් ගේ ක්‍රියාකාරී ඉගෙනුම, ස්වයං ඉගෙනුම සහ අන්තර් ක්‍රියා සඳහා ඉගෙනුම වැනි ශිෂ්‍ය ඉගෙනුම් අවස්ථා උද්දීපනය කිරීම සඳහා ය.


---- ----- -----

ශිෂ්‍ය ක්‍රියාකාරී ක්‍රමවේද අතරින් ගැටලු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රියාවලිය, ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රියාවලිය සහ භූමිකා රංගන/නාට්‍ය ක්‍රම පිළිබඳව මෙම මොඩියුලය මගින් ඔබට අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දී ඇත.

----- ----- -----

අපි පළමුව ගැටලු විසදුම් පාදක ඉගෙනුම් ක්‍රමවේදය පිළිබඳව අධ්‍යයනය කරමු.

## ගැටලු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රමවේදය





භෞතික හා සමාජ පරිසරය සමඟ කෙරෙන නිරන්තර අරගලයේ දී පැන නගින විවිධාකාර ගැටලු විසඳාගෙන සාර්ථකව ජීවිතයට මුහුණදීමේ හැකියාව ශිෂ්‍යයා තුළ ඇති කිරීම නම් වූ අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණට මෙම ක්‍රමවේදය සහාය වෙයි. අනාගත වැඩලෝකයට අවශ්‍ය නිපුණතා ශිෂ්‍යයාට ලබා දීමට යෝග්‍ය ඉගෙනුම් ක්‍රම ශිල්පයක් ලෙසට මෙය හඳුන්වා දිය හැක. ජෝන් ඩුවී නම් අධ්‍යාපනඥයාගේ දර්ශනය මත පදනම් වූ ඉගැන්වීම් ක්‍රමයකි. පහත වෙබ් අඩවි පරිශීලනයෙන් ජෝන් ඩුවී ගේ දර්ශනය පිළිබඳව වැඩිදුර කරුණු දැනගත හැකිය.

(https://en.wikipedia.org/wiki/john-Dewey, yourarticlelibraray.com/education/John-Deweys-view-on-education/69149)


------ ----- -----

මෙම ක්‍රමවේදය තුළින් ඉගෙනුම්ලාභියා පහත සටහනේ පරිදි ක්‍රියාකාරී ඉගෙනුමට පෙළඹෙයි.



**ගැටලු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රියාවලියෙන්......**

- අපි විනෝදයෙන් ඉගෙන ගන්නවා
- අලුත් අලුත් දේ ගැන හිතන්න පුරුදු වෙනවා
- යාලුවන්ට ඇහුම්කන් දීල තීරණ ගන්න පුරුදු වෙනවා
- කට පාඩම් කර ඉගෙන ගන්න ක්‍රමයෙන් බැහැර වෙනවා
- යම් යම් දේවල් පිළිබඳව විශ්ලේෂණය සංස්ලේෂණය කරන්න පුරුදු වෙනවා
- ස්වයං ඉගෙනීමකට පෙළඹෙනවා



------ ----- -----


ගැටලු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රමවේදයේ ප්‍රධාන අංග ඔබගේ පහසුව පිණිස මෙසේ දක්වමු.

**ගැටලු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රමවේදයේ ප්‍රධාන අංග**

- කණ්ඩායම් ක්‍රියාකාරකම්
- ගුරු-සිසු, සිසු-සිසු සාකච්ඡා සහ සවන්දීම
- ගුරුවරයා සුසාධ්‍යවරයෙකු ලෙස ක්‍රියා කිරීම
- සිසු අදහස් අනුව තීරණ ගෙන සුදුසු පරිදි ගැටලු නිරාකරණයට පෙළඹීම
- කාල කළමනාකරණයට සහ උපදෙස් පිළිපැදීමට පුහුණුවක් ලැබීම

------ ------- -----


මෙම ක්‍රමවේදය භාවිතයේ දී ඉගෙනුම්ලාභීන් පහත සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙති.




----- ----- -----

ඔබගේ අධ්‍යයනය පහසුකරලීම පිණිස මෙම ක්‍රමවේදයේ ප්‍රධාන පියවර 04 අධ්‍යයනය කරමු.

**ගැටලු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රමවේදයේ දී භාවිතාවන ප්‍රධාන පියවර හතර**




------ --------- ------–

එම පියවරයන් පන්තිකාමර උගැන්වීමේ දී භාවිතා කළ හැකි උදාහරණ කීපයක් දෙසට දැන් ඔබගේ අවධානය යොමු කරමු.

I. ගුරුවරයා ලබාදුන් ගෙදරවැඩ කර ගෙන ඒමේ දී ශිෂ්‍යයන්හට මුහුණදීමට සිදුවන ගැටලු
II. කොරෝනා වෛරසය ඉතා සීඝ්‍රයෙන් පැතිරයාම නිසා එය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සොයා බැලීම
III. පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට පුරුදුවීම
IV. මාර්ග අනතුරු බහුලවීම
V. හදවත් රෝග සීඝ්‍රයෙන් වැඩිවීම

ඉන් එක් ක්‍රියාවලියක් සඳහා මෙසේ උදාහරණයක් ගෙන බලමු.

## නියැදි ක්‍රියාවලියක් සඳහා උදාහරණ - 1

**ගුරුතුමා/ගුරුතුමිය ලබාදුන් ගෙදරවැඩ කර ගෙන ඒමේ දී ශිෂ්‍යයන්හට මුහුණදීමට සිදුවන ගැටලුවලට විසඳුම් සොයා ගැනීම**



**නියැදි ක්‍රියාවලියක් සඳහා උදාහරණ - 2**

**වීඩියෝපටය - 1**


**රෝගියෙකුගේ රෝගය හඳුනාගෙන බෙහෙත් ලබාදීම**

------------ ---------- ----------------

## නියැදි ක්‍රියාවලියක් සඳහා උදාහරණ - 3

කොරෝනා වෛරසය ඉතා සීඝ්‍රයෙන් පැතිරයාම නිසා එය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සොයා බැලීම

පන්ති කාමරය තුළ දී මෙසේ ක්‍රියාකාරකමක් සිදු කරමු.




**ඉහත සටහනේ 4වන පියවර වීඩියෝ පටයකින් මෙසේ දක්වමු.**

**වීඩියෝපටය - 2**

**කොරෝනා වෛරසය ඉතා සීඝ්‍රයෙන් පැතිරයාම නිසා එය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග අනුගමනය**

---------   -------------   ---------------

මෙම මොඩියුලය අධ්‍යයනයෙන් ඔබ ලබාගත් දැනුම දැන් පරීක්ෂාකර බලමු. එක් පිළිතුරකට එක් ලකුණ බැගින් හිමි වේ. (පිළිතුරු අනෙක් පිටුවේ)

| ප්‍රකාශය | | හරි (✓) | වැරදි (X) |
|---|---|---|---|
| 1. | ගැටලු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රියාවලිය යනු විද්‍යාත්මක ඉගෙනුම් ක්‍රමවේදයක් නොවේ. | | |
| 2. | මෙය සාම්ප්‍රදායික දේශන ක්‍රමවේදයක් නොව ශිෂ්‍යයින්ගේ චින්තනයට අභියෝග කරයි. | | |
| 3. | ගුරුවරයා ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරන්නෙකු බවට පත්වෙයි. | | |
| 4. | ශිෂ්‍යයන් නිවැරදි තීරණ ගැනීමට පෙළඹේ. | | |
| 5. | ස්වයං ඉගෙනුමට පෙළඹෙයි. | | |
| 6. | මෙම ක්‍රමවේදය ප්‍රධාන පියවර හතකින් සමන්විතය. | | |
| 7. | මෙම ක්‍රමවේදය ගුරුවරයෙකු නොමැතිව වුව ද ක්‍රියාත්මක කළ හැකිය. | | |
| 8. | මෙම ක්‍රමයෙන් සිසුන් තුළ මානුෂීය ගුණධර්ම දියුණුවීමට අවස්ථාවක් නොමැත. | | |
| 9. | නවක ගුරුවරයෙකුට මෙම ක්‍රමවේදය අනුව පාඩම් සැලසුම් කිරීමට අපහසුය. | | |
| 10. | දත්ත රැස් කිරීම, වර්ගගත කිරීම, දත්ත විශ්ලේෂණය පිළිබඳ මූලික දැනුමක් මෙම ක්‍රමවේදයේ දී ගුරුවරයාට අත්‍යවශ්‍ය වේ. | | |

e-Learning by TEA
Teacher Education Administration Branch

------------ ---------------- ---------------

පිළිතුරු -

| | |
|---|---|
| 1 | වැරදි |
| 2 | හරි |
| 3 | හරි |
| 4 | හරි |
| 5 | හරි |
| 6 | වැරදි |
| 7 | වැරදි |
| 8 | වැරදි |
| 9 | වැරදි |
| 10 | හරි |


--------- ------- --------

දෙවනුව අපි ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රමවේදය පිළිබඳව අධ්‍යයනය කරමු.

**ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රමය**


- ක්‍රියාකාරී අධ්‍යාපන ක්‍රමවේදයකි
- ජෝන් ඩුවි ගේ දර්ශනය මත ක්‍රිලී පැට්‍රික් සංවර්ධනය කර ඇත.
- නිශ්චිත අරමුණක් ඉටුකර ගැනීමට ක්‍රියාත්මක කෙරෙන ක්‍රියාවලියකි.
- කිසියම් ගැටලුවකට විසඳුම් ද මෙමගින් ලබාදිය හැක.

**ව්‍යාපෘතියක් යනු** - තෝරාගත් අරමුණක් ඉටුකර ගැනීම සඳහා පිරිවැය, කාලය හා ගුණය පිළිබද සලකා බලමින් ක්‍රියාත්මකවන ආරම්භයක් හා අවසානයක් ඇති ක්‍රියාවලියකි.



------------- -------------- -------------------

**ව්‍යාපෘතියක අඩංගු ප්‍රධාන අංග මෙසේ හඳුනා ගනිමු.**




----- ------- ----- --------

e-Learning by TEA


ඉහත සටහනේ දක්වා ඇති ව්‍යාපෘති අංග සවිස්තරාත්මකව විමසා බලමු.

| | |
|---|---|
| අරමුණු<br>SMART | S Specific සුවිශේෂී විය යුතුයි<br>M Measurable මැනියහැකි විය යුතුයි<br>A Achievable සාධනය කරගතහැකි විය යුතුයි<br>R Relevant අදාළ විය යුතුයි<br>T Time Bound කාලසීමාවක් දැක්විය යුතුයි |
| කාලය<br>Time | ▪ ව්‍යාපෘතිය කිසියම් රාමුවකට අනුව සැලසුම් කළ යුතුයි.<br>▪ ඒ ඒ කාලසීමාවට අදාළ ක්‍රියාකාරකම් පැහැදිලිව දැක්විය යුතුයි.<br>▪ කාලරාමුව මගින් මෙය පෙන්වාදියහැකිය. |
| පිරිවැය<br>Budget | ▪ ව්‍යාපෘතියක් සඳහා මානව හා භෞතික සම්පත් (Men, Material, Money, Machine) මිනිසුන්, ද්‍රව්‍ය, යන්ත්‍ර හෝ මුදල් යෙදවිය යුතුය.<br>▪ ඒ සඳහා යන වියදම අයවැය ලේඛනයකින් දැක්විය යුතුය. |
| ගුණය<br>Quality | ▪ ගුණාත්මකබව<br>▪ බාහිර පෙනුම<br>▪ අභ්‍යන්තර තත්වය<br>▪ කල් පැවැත්ම<br>▪ අරපිරිමැස්ම |

e-Learning by TEA
Teacher Education Administration Branch

------- ------- ------ ---- - --- - - - - -

**පාසල් සිසුන් සඳහා යෝග්‍ය ව්‍යාපෘති වර්ග කීපයක් මෙසේ හඳුනා ගනිමු.**




------ -------- --------- ------

ඔබ ව්‍යාපෘතියක් සැලසුම්කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව පළමුවෙන් ම අවධානය යොමු කරන්න.

| | |
|---|---|
| 1. කුමක් ද? | ව්‍යාපෘතිය මගින් කිරීමට අපේක්ෂිත කාර්යයන් (උදාහරණ - පාසල් පුස්තකාලයට අලුත් පොත් ලබාගැනීම) |
| 2. කාට ද? | ව්‍යාපෘතියෙන් ඉලක්ක කරන ජන කණ්ඩායම (උදාහරණ - ප්‍රාථමික සිසුන් සඳහා, ද්විතීයික ශ්‍රේණිවල පිරිමි ළමුන් සඳහා, උසස් පෙළ ගැහැණු ළමුන් සඳහා, මුලු පාසලේ සිසු ජනගහනය සඳහා) |
| 3. කොහේ ද? | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශය, පසුතලය, ස්ථානය |
| 4. කවදා ද? | මාස 1ක්, මාස 3ක්, වසරක්, වසර 2ක් වැනි කාලයක් තුළ දී |
| 5. කොපමණ ද? | ව්‍යාපෘතියෙන් ඉලක්ක ජන සංඛ්‍යාව |

------------- -------- -----------

එම කරුණු උදාහරණයක් මගින් මෙසේ දක්වමු.

### ව්‍යාපෘතියකට අදාළ ක්‍රියාකාරකම් සහ
### කාල රාමුව ගාන්ට් සටහන (Gantt Chart) මගින් දැක්වීම

කුමක්ද? → ප්‍රාථමික ශ්‍රේණියේ සිසුන් ගේ කියවීම වර්ධනය කිරීම සඳහා කතාන්දර පොත් 100ක් පාසල් පුස්තකාලයට පරිත්‍යාග කිරීම

කාටද? → විද්‍යාවර්ධන විදුහලේ ප්‍රාථමික අංශයේ සිසුන් 500 දෙනෙක් සඳහා

කොහේද? → ර/බඹරකොටුව විද්‍යාවර්ධන විදුහල, වේවැල්වත්ත, රත්නපුර

කවදාද? → ........වසරේ ජනවාරි සිට අප්‍රියෙල් දක්වා මාස 4ක කාලයක් තුළ

කොපමණද ? → ප්‍රාථමික අංශවල සිසුන් 500ක් සඳහා පුංචි කතන්දර පොත් 100ක්


<u>කාල රාමුව - ගාන්ට් සටහන</u>

| ක්‍රියාකාරකම | ජනවාරි | | | | පෙබරවාරි | | | | මාර්තු | | | | අප්‍රියෙල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය |
| විදුහල්පති අවසරය හා ව්‍යාපති අරමුණු පිළිබඳව පාසල් ප්‍රජාව දැනුවත් කිරීම | | | | | | | | | | | | | | | | |
| ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා දෙමාපියන් දැනුවත් කර අවශ්‍ය මුල්‍ය සම්පත් ලබාගැනීම | | | | | | | | | | | | | | | | |
| අයවැය ඇස්තමේන්තු සකස්කර අලුත්පොත් මිළදී ගැනීම | | | | | | | | | | | | | | | | |
| මිළදීගත් පොත් අංකනය කිරීම | | | | | | | | | | | | | | | | |
| පුස්තකාල පොත් රාක්කවල තැබීමට සහාය වීම | | | | | | | | | | | | | | | | |
| නව නීති රීති යෝග්‍ය පරිදි ප්‍රදර්ශනය කිරීම | | | | | | | | | | | | | | | | |
| නව පුස්තකාල පොත් පිළිබඳව ප්‍රාථමික අංශයේ ගුරුවරුන් හා සිසුන් දැනුවත් කිරීම | | | | | | | | | | | | | | | | |
| පොත් 100 පුස්තකාලයට ලබාදීම හා ව්‍යාපෘතිය ඇගයීම | | | | | | | | | | | | | | | | |

------ ------ ------

ව්‍යාපෘතිය අගැයීම යනු ව්‍යාපෘතියේ අරමුණුවලට සාපේක්ෂව ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන අවස්ථාවේදී හෝ ව්‍යාපෘතිය අවසානයේදී එහි සාර්ථකත්වය මැන බැලීමයි.
එම ක්‍රියාවලිය මෙසේ විමසා බලමු.

**ව්‍යාපෘතිය ඇගයීම**




----- ------- ----------

**ව්‍යාපෘතියක් අගැයීමේ අරමුණු පහත පරිදි වේ.**

i. ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටුවීදැයි බැලීම සඳහා
ii. ව්‍යාපෘතියේ දුබලතා හා ප්‍රබලතා හඳුනා ගැනීම සඳහා
iii. මෙතෙක් ක්‍රියාත්මක වූ අනෙකුත් ව්‍යාපෘති සමඟ සසඳා බැලීම සඳහා
iv. ක්‍රියාත්මක කිරීමේ අභියෝග තුළින් අනාගත ව්‍යාපෘති සඳහා පාඩම් ඉගෙනීමට
v. ව්‍යාපෘති පිරිවැය-ප්‍රතිලාභ විග්‍රහ කිරීමට

-------- ------- -------- ---------------

**ව්‍යාපෘතියක් අගැයීමේදී සලකා බැලිය යුතු කරුණු මෙසේ දක්වමු.**

i. ව්‍යාපෘති අරමුණු ඉටුවී ද
ii. යෙදවුම් හා සම්පත් කාර්යක්ෂමතාවකින් යොදාගෙන තිබේ ද
iii. ව්‍යාපෘති ක්‍රියාවලිය අදාළ පරිදි සිදුවේ ද
iv. නිමැවුමේ ගුණාත්මකබව කෙසේ ද
v. ව්‍යාපෘතියෙන් ඉලක්කගත කණ්ඩායමට දිගුකාලීන ප්‍රතිඵල අත්විඳිය හැකි ද

-------- --------------- ---------------

වයාපෘතිය අගයන්නේ කා විසින් ද?

i. වයාපෘතියට සම්බන්ධ අය විසින් ම (අභ්‍යන්තරව) වයාපෘතිය අගැයීම
ii. බාහිර පාර්ශවයන් විසින් අගැයීම

අභ්‍යන්තරව සහ බාහිරව වයාපෘති අගැයීමේ වෙනස්කම් සලකා බලමු.

| අභ්‍යන්තර අගැයීම | බාහිර අගැයීම |
| --- | --- |
| • වයාපෘතිය හොඳින් දකී.<br>• පෞද්ගලික සබඳතා නිසා විෂයමුල අගැයීම නැත.<br>• අගැයීම පිළිබඳ විශේෂඥ දැනුමක් නොමැති වීමට පුලුවන.<br>• වයාපෘතිය හොඳින් තේරුම් ගනී. | • වයාපෘතිය දෙස නව දෘෂ්ඨියකින් බලයි<br>• පෞද්ගලික සබඳතා නැත<br>• අගැයීම සම්බන්ධ විශේෂඥයින් සිටියහැක<br>• වයාපෘතිය හොඳින් තේරුම් ගැනීම දුෂ්කරවිය හැක |

------------ ------------- ---------------

**ඔබ වයාපෘති වාර්තාවක් සකස් කිරීමේදී පහත අංග ඇතුලත් කළ යුතු වේ.**

1. වයාපෘතියේ නම
2. වයාපෘතිය පිළිබඳ කෙටි පසුබිම් විග්‍රහයක්/හැඳින්වීම
3. වයාපෘතියේ අරමුණු
4. වයාපෘතිය සඳහා යොදාගත් ක්‍රමය හා අදාළ භෞතික හා මානව සම්පත්
5. වයාපෘති ක්‍රියාවලිය
6. කාල රාමුව
7. ප්‍රගති සමාලෝචනය
8. වයාපෘති නිමාව සහ නව යෝජනා
9. අදාළ තොරතුරු ලබාගත් ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය
10. වයාපෘතිය සඳහා අදාළ බලධාරීන්ගෙන් ලබාගත් ලිපිය

--------- --------- --------------

මෙම ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රමවේදය පිළිබඳ මොඩියුලය අධ්‍යයනයෙන් ඔබ ලබාගත් දැනුම දැන් පරීක්ෂාකර බලමු. එක් පිළිතුරකට ලකුණු 5 බැගින් හිමි වේ. (පිළිතුරු අනෙක් පිටුවේ)

1. ව්‍යාපෘතියක් යනු කුමක් ද?
2. ව්‍යාපෘතියක අරමුණු කෙසේ විය යුතු ද?
3. ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රමවේදයෙන් ශිෂ්‍යයන්හට ලැබෙන වාසි 3ක් සඳහන් කරන්න
4. ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රමවේදයකදී ගුරු භූමිකාව කෙසේ විය යුතු ද?
5. ව්‍යාපෘතියකට කාල රාමුවක් යොදා ගත යුත්තේ කවර හේතුවක් නිසා ද?
6. ව්‍යාපෘති අගැයීමක් කළ යුත්තේ කුමන හේතු නිසාදැයි කෙටියෙන් පහදන්න.

------------ ----------- -------------

<u>පිළිතුරු</u>:

1) නිශ්චිත අරමුණක් ඉටුකර ගැනීම සඳහා පිරිවැය, කාලය හා ගුණාත්මකබව පිළිබඳ සලකා බලමින් ක්‍රියාත්මක කරන ආරම්භයක් හා අවසානයක් ඇති ක්‍රියාවලියකි

2) SMART විය යුතුය. එනම්,

| | | |
|---|---|---|
| S | Specific | සුවිශේෂී විය යුතුයි |
| M | Measurable | මැනියහැකි විය යුතුයි |
| A | Achievable | සාධනය කරගතහැකි විය යුතුයි |
| R | Relevant | අදාළ විය යුතුයි |
| T | Time Bound | කාලසීමාවක් දැක්විය යුතුයි |

3)
- සැලසුම් සහගතව යමක් කිරීමට පෙළඹීම
- නිවැරදි තීරණ ගැනීමේ හැකියාව වැඩිදියුණුවීම
- නායකත්වයට හා අනුගාමිකත්වයට හුරුවීම
- එකිනෙකාගේ විභව්‍යතා හඳුනා ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීමට ඇති හැකියාව වර්ධනය කිරීම
- ස්වයංවිනය වර්ධනයවීම
- ජීවිතයට සැබෑ අත්දැකීම් ලබාගැනීම
- ප්‍රජා සබඳතා පැවැත්වීමට හුරුවීම
- ඉවසීම, අවංකබව වැනි උසස් මානසික ගුණාංගවලින් පෝෂණය වීම

(ඉහත කරුණු වලින් අවම වශයෙන් 3ක් ඉදිරිපත් කළ හැකිවීම ප්‍රමාණවත්)

4) සුසාධ්‍යකාරකයෙකු හෝ සම්පත්දායකයෙකු වශයෙන් ක්‍රියාකරයි.

5) ව්‍යාපෘතියක් යනු සැලසුම්ගත ක්‍රියාවලියක එකතුවකි. ඒ එක් එක් ක්‍රියාවලිය නිශ්චිත කාල රාමුවකට යටත් නොකළහොත් ව්‍යාපෘතියේ සැලසුම් අසාර්ථක වී ව්‍යාපෘතිය අවසන් කිරීමට නිශ්චිත කාලයක් නොමැති වී යයි.

6) - ව්‍යාපෘති අරමුණු ඉටුවීදැයි දැන ගැනීමට
   - යෙදවුම්, සම්පත් නිසි පරිදි පරිහරණය කළේද යන්න දැනගැනීමට
   - නිමැවුමේ ගුණාත්මක බව මැන ගැනීමට
   - ව්‍යාපෘති ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මකවීද කියා මැනගැනීමට
   - ව්‍යාපෘතියෙන් ඉලක්කගත කණ්ඩායමට දිගුකාලීන ප්‍රතිලාභ ලැබේද යන්න සොයා බැලීමට

------ ------ -- -- -----

e-Learning by TEA
Teacher Education Administration Branch

**තෙවනුව අපි භූමිකා රංගන/නාට්‍ය ක්‍රමවේදය ගැන විමසා බලමු.**

| රංගනය | භූමිකා රංගනය | නාට්‍ය ක්‍රමය |
|---|---|---|

**ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමවේදයකි.**

**විෂය කරුණු අවබෝධයට පහසු කරවයි.**

**සිසුන් විනෝදයෙන් ප්‍රබෝධමත්ව ඉගෙනුම ලබයි.**

**නාට්‍යමය ස්වරූපයෙන් චරිත නිරූපනය කරයි.**

**සජීවී අත්දැකීම් ළමුන්ට ලබා දෙයි.**

**විවිධ චරිතයන්හි සුවිශේෂී ගති ලක්ෂණ ප්‍රතිනිර්මානය කිරීමට හැකිවෙයි.**

**ගුරු සිසු සබඳතා වැඩිදියුණු කරයි.**

**සිසු නිර්මාණශීලිත්වය සහ කුසලතා ඔපමට්ටම් වේ.**

**පෙර සූදානමක් තිබිය යුතුයි.**

**මෙම ක්‍රමවේදයේ දී පහත සඳහන් කරුණු සැලකිය යුතු වේ.**

- නාට්‍ය ක්‍රමයට ගැලපෙන විෂය කරුණු තෝරාගත යුතුය.
- අපේක්ෂිත පාඩම් අරමුණු ඉටුවන පරිදි සංවිධානය කළ යුතුය.
- කළ යුතු දේ පිළිබඳව නිරවුල්ව සිසුන්ට පහදා දිය යුතුය.
- දෙබස් සජීවී නාට්‍යමය ස්වරූපයේ විය යුතුය.
- වැඩි සිසු පිරිසකට අවස්ථාව ලබාදිය යුතුය.
- සිසු දක්ෂතා ඔපමට්ටම් විය යුතුය. සිසු දක්ෂතා අගය කළ යුතුය.
- අර්ථවත් දෙබස්/ගීත යොදාගත යුතුය.
- විදුහලේ අන් කටයුතුවලට බාධා නොවිය යුතුය.
- වියදම්/මිල අධිකවන ලෙස ඇඳුම් හෝ පසුතල නිර්මාණ නොකල යුතුය.
- කාලය නිසි පරිදි කළමනාකරණය කරගත යුතුය.
- පාඩම අවසානයේදී අදාළ විෂය කොටස් සිසුන්ට අවබෝධවීදැයි පසුවිපරම් කළ යුතුය.
- අවසානයේදී ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය සිසුන්ට ලබාදිය යුතුය.

------------- ----------------- ---------------- ------- -------- -----------

## භූමිකා රංගන ක්‍රමයේ ප්‍රයෝජන

- ❖ පාඩමක (පිවිසීම/පාඩම් සංවර්ධනය/ඇගයීම) ඕනෑම පියවරකදී භාවිතා කළහැකිවීම
- ❖ සිසුන්ගේ සක්‍රීය සහභාගිත්වය ලබාගත හැකිවීම
- ❖ සිසුන්හට සජීවී ඍජු අත්දැකීම් ලබාගැනීමට හැකිවීම
- ❖ පන්තිකාමර අධ්‍යාපන වාතාවරණය තුළ විවිධත්වයක් ඇතිකළහැකිවීම
- ❖ විවිධ විෂය දැනුම, කුසලතා, ආකල්ප සජීවීව ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය හා බද්ධ කළහැකිවීම
- ❖ සිසුන්හට ක්ෂණිකවම ප්‍රතිපෝෂණයක් ලබාගතහැකි වීම
- ❖ එකිනෙකා සමඟ සුහදව කටයුතු කිරීමෙන් සහානුභූතිය, සහකම්පනය, චිත්තවේග පාලනය, අන්‍ය අදහස්වලට ගරුකිරීම වැනි මානුෂීය ගුණධර්ම වැඩිදියුණු කරගැනීමට හැකිවීම

------------------------------------------------------------------------------------------------------------------------

e-Learning by TEA
Teacher Education Administration Branch

**භූමිකා රංගනයකට යොදාගතහැකි පාඩමක් අධ්‍යයනය කරමු.**

| |
|---|
| වීඩියෝ පටය : 6 වසර - PTS - මානසික යහපැවැත්ම |

අමාලි හා පියුමි පාසල ඇරී ගෙදර යන විටදී අමුත්තෙකු ඔවුන්ගෙන් පාසලට යන පාර අසයි. ඔවුන් පාර නිවැරදිව කියූ විට ඔහු ප්‍රශංසා කර ටොෆි බෑගයකින් ඔවුන්ට සංග්‍රහ කිරීමට සැරසෙයි. එය පිළිගැනීමට පෙර ඔවුන් දෙදෙනා අමුත්තාට නොඇසෙන ලෙසට සාකච්ඡාවක යෙදෙයි.

පියුමි — අපි ගමුද ටොෆි බෑගය?

අමාලි — එපා ! අම්ම කියල තියනවනේ නාඳුනන අයගෙන් කිසි දෙයක් ගන්න එපා කියලා.

පියුමි — ඒත් මේ මාමා හොඳ කෙනෙක් වගේ. එයා ඇහුවෙත් පාසලට යන පාරනේ.

අමාලි — ඒ වුනාට අපි හරියටම එයාව අඳුනන්නෙ නැහැ නේ. ඒ නිසා ගන්න එපා. මතක නැද්ද සෞඛ්‍ය ටීචත් අපිට කිව්වෙ නාඳුනන අය දෙන දේවල් ගන්න එපා කියල.

පියුමි — ඒත් අපි දැන් කොහොමද එපා කියන්නේ ?

අමාලි — මාමේ අපේ අම්මා අපි එනකල් මග බලා ඉන්නවා. කෑම කන්නත් තියෙන නිසා දැන් අපිට ටොෆි එපා. බොහොම ස්තුතියි.

------------- ------------- ------------- ------------

| වීඩියෝ පටය | වීඩියෝ පටය | වීඩියෝ පටය | වීඩියෝ පටය |
|---|---|---|---|
| unknown person ---- (ප්‍රාථමික ශ්‍රේණි) | තොරතුරු සන්නිවේදනය ... | මුලුතැන්ගෙයි උපකරණ හඳුන්වා දීම | හැඩතල පන්තිය |

------------ ----------------- -----------------

දැන් අපි භූමිකා රංගන/නාට්‍ය ක්‍රමවේදය පිළිබඳව උගත් දෑ නැවත විමසා බලමු. ඒ සඳහා පහත දැක්වෙන ප්‍රකාශන සුදුසු වචන/වචනයක් යොදා සම්පූර්ණ කරන්න. එක් ප්‍රශ්නයක පිළිතුරු සඳහා ලකුණු 4ක් හිමිවේ.

1. භූමිකා රංගන ඉගෙනුම් ක්‍රමවේදය භාවිතයේ දී ඉගෙනුම්ලාභීන්ට ........... ........ ලබා ගැනීමට අවස්ථාව ලැබේ.

2. මෙම ක්‍රමවේදයේ දී ඉගෙනුම්ලාභීන් ............................................ ඉගෙනුම් ක්‍රියාවලියේ යෙදේ.

3. මෙහි දී අනිවාර්යයෙන් ම .................... .............................. තිබිය යුතුය.

4. නාට්‍යානුසාරයෙන් පාඩම් අන්තර්ගතය ඉදිරිපත් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණක් වනුයේ ....... ................ ඇඳුම් හා පසුතල නිර්මාණයන් නොකළ යුතු බවයි.

5. භූමිකා රංගන වැදගත් වන්නේ එය පාඩමක .................... ............ ................. පියවරයන්හි දී භාවිතා කළ හැකි වීමය

------ ----- -----

<u>පිළිතුරු</u>:

1. සෘජු/සජීවී අත්දැකීම්
2. ප්‍රබෝධමත්ව/ප්‍රීතියෙන්
3. පෙර සූදානමක්
4. මිල අධික
5. පිවිසීම/පාඩම් සංවර්ධනය/ඇගයීම

-----------------

**සමස්ත ඇගයීම ---**

මෙම මොඩියුලය පරිශීලනය කිරීමෙන් ශිෂ්‍ය ක්‍රියාකාරී ක්‍රමවේද 03 (ගැටළු විසඳුම් පාදක, ව්‍යාපෘති පාදක, භූමිකා රංගන) පිළිබඳව ඔබට පැහැදිලි අවබෝධයක් ලැබී ඇතැයි සිතමු. ඒ පිළිබඳව ස්වයං තක්සේරුවක් සඳහා පහත සඳහන් ප්‍රශ්නාවලිය ඔබ වෙත ලබා දී ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියෙන් දී ඇති වරහන තුළ සඳහන් කරන්න. මෙම ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීමෙන් ඔබ ලබා ගන්නා ලකුණු සහ එක් එක් ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ ලබාගත් ලකුණුවල එකතුවත් සලකා බලා, ඔබ සියළුම ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු ලබා දී ඇත්නම් ඔබට සහතික පත්‍රයක් ලබා ගත හැක. ඒ ඒ පිළිතුරට ලකුණු 4 බැගිනි.

1. ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් සකස් කිරීමට ගුරුවරයෙකුට ඔහුගේ,
*(1) ඉගන්වීමේ පළපුරුද්ද, (2) නිර්මානශීලී බව (3) විෂය දැනුම (4) ළමුන් ගේ චර්යා රටාවන් පිළිබඳ දැනුම* බෙහෙවින් ඉවහල් වේ. (....)

2. *(1) බුද්ධි කලම්බනය (2) සාකච්ඡා (3) පැවරුම් (4) දේශන*
ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමවේදයක දක්නට නොමැත. (.....)

3. අනාගත වැඩ ලෝකයට අවශ්‍ය නිපුණතා ඉගෙනුම්ලාභියා වෙත ලබාදීමට ඉගෙනුම් ක්‍රමවේද සකස් කළ යුතු බවට
*(1) මාස්ලෝ (2) ජෝන් ලුවී (3) ජීන් ජැක් රූසෝ (4) මාරියා මොන්ටිසෝරි*
නමැති අධ්‍යාපන දාර්ශනිකයා විසින් ප්‍රකාශ කර ඇත. (.....)

e-Learning by TEA
Teacher Education Administration Branch

4. ගැටළු විසඳුම් පාදක ඉගෙනුම් ක්‍රමවේදයේ දී භාවිතාවන හතරවන පියවරේ දී ඉගෙනුම්ලාභියාට
*(1) දෙමාපිය (2) විදුහල්පති (3) විෂයභාර ගුරු (4) වැඩිහිටි සිසුන් ගේ*
උපකාරය අවශ්‍යවනු ඇත. (.....)

5. පාසල් පාදක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමකට පිරිවැයක් දැරීමට සිදු වුවහොත් ඒ සඳහා අවශ්‍ය අය වැය ලේඛනය අනුමත කරවා ගත යුත්තේ
*(1) ව්‍යාපෘති භාර ගුරුවරයා (2) විදුහල්පති (3) දෙමාපියන් (4) පන්තිභාර ගුරුවරයා* වෙතිනි. (.....)

6. පාසල් සිසුන් සඳහා යෝග්‍ය නොවන්නේ
*(1) සිසු සුභසාධනය (2) ඉගෙනුම් ක්‍රියාවලිය (3) ගුරු සංවර්ධනය (4) විෂය සමගාමී*
සඳහා වූ ව්‍යාපෘතියකි. (......)

7. ව්‍යාපෘතියක් ඇගයීම වැදගත් වන්නේ, එහි
*(1) අරමුණු ඉටුවීම (2) දුබලතා හඳුනා ගැනීම (3) නිමැවුමේ ගුණාත්මක බව මැන බැලීම (4) ලකුණු ලබාදීම*
පිළිබඳව එම ක්‍රියාවලිය අවසානයේ දී සලකා බැලිය යුතු බැවිනි. (......)

8. භූමිකා රංගන ක්‍රමවේදයේ දී
*(1) විශේෂ වේදිකා (2) සුවිශේෂී ඇඳුම් පැළඳුම් (3) සංගීතය (4) කාල කළමනාකරණය*
පිළිබඳව සැලකිල්ලට ගත යුතුව ඇත. (....)

9. ඉහත සඳහන් ඉගෙනුම් ක්‍රමවේදය
*(1) වැඩි ශිෂ්‍ය සහභාගිත්වයට (2) ශිෂ්‍ය සහජ හැකියාවන්ට (3) ගුරුභවතාගේ නිර්මානශීලී බවට (4) පාසල් වැඩ කටයුතුවලට බාධා සිදුකිරීමට*
ඉඩ ප්‍රස්ථාව ලබා දෙයි. (......)

10. භූමිකා රංගනයක් සැලසුම් කිරීමේ දී ගුරුභවතාට
*(1) අදාළ කතා තේමාව පිළිබඳ දැනුවත් බවක් (2) විවිධ චරිතාංග අධ්‍යයනයක් (3) පාඩම් අරමුණු පිළිබඳ නිවැරදි වැටහීමක් (4) නාට්‍ය හා රංග කලාව පිළිබඳ උපාධියක්*
තිබීම අවශ්‍ය නොවේ.

----------- ---------- ----------

පිළිතුරු:

1.(4) 2.(4) 3.(2 ) 4.(3) 5.(2) 6.(3) 7.(4) 8.(4) 9.(4) 10.(4)

**ලකුණු මට්ටම**

| | |
|---|---|
| 00-20 | නැවත නැවතත් මොඩියුලය හොඳින් අධ්‍යයනය කර අභ්‍යාසවලට පිළිතුරු සපයන්න |
| 20-40 | නැවත මොඩියුලය හොඳින් අධ්‍යයනය කර අභ්‍යාසවලට පිළිතුරු සපයන්න |
| 40-60 | මොඩියුලය අධ්‍යයනය කර අඩුපාඩු නිවැරදි කර ගන්න |
| 60-80 | මොඩියුලය හොඳින් අධ්‍යයනය කර ඇත. ප්‍රායෝගිකව අත්හදා බලන්න |
| 80-100 | ක්‍රියාකාරී ක්‍රමවේද 3 පිළිබඳව ඉතා හොඳ අවබෝධයක් ලබාගෙන ඇත. |

ඉහත ප්‍රශ්නාවලිය පහත දැක්වෙන දිගුවෙන් (link) ද ලබා ගත හැකි ය.

Link: https://forms.gle/o4gvKYfUWw1PxPH27